සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**14 S I, II**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2015 දෙසැම්බර්**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2015 டிசெம்பர்**
**General Certificate of Education (Ord. Level) Examination, December 2015**

| | |
|---|---|
| **කතෝලික ධර්මය** | **I, II** |
| கத்தோலிக்கத் திருமறை | **I, II** |
| Catholicism | **I, II** |

## කතෝලික ධර්මය II

- ❋ **පළමුවන** ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
- ❋ පළමුවන ප්‍රශ්නයට ලකුණු **20** ක් ද, තෝරා ගන්නා එක් ප්‍රශ්නයකට ලකුණු **10** බැගින් ද හිමි වේ.

**1.** (i) උත්පත්ති පොතේ පළමු හා දෙවන මැවීමේ කථා පුවත් අයත් වන සම්ප්‍රදායන් **දෙක** ලියන්න.
(ii) මාංශගතවීමේ අභිරහස් සිහිපත් කිරීම සඳහා අප භාවිත කරන යාච්ඤා **දෙක** මොනවා ද?
(iii) දේව දරුවකු වීම සහ නව ජීවනය ශක්තිමත් කිරීම සඳහා කැඳවීම ලබන ප්‍රසාද නිධාන **දෙක** නම් කරන්න.
(iv) ප්‍රසාද ස්නාපනය, අභිවෘද්ධි ආලේපය සහ පූජකවරය යන සක්‍රමේන්තුවල පොදු ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න.
(v) යහපත් පාපෝච්චාරණයක පියවර **දෙකක්** ලියන්න.
(vi) යාච්ඤාවේ දී පරිසිවරයා තුළ ඉස්මතු වූ ලක්ෂණයක් සහ අයකැමියා තුළ ඉස්මතු වූ ලක්ෂණයක් ලියන්න.
(vii) ක්‍රිස්තුන් වහන්සේ සැබෑ දේව පුත්‍රයාණන් බවට ශුද්ධ වූ ත්‍රිත්වය ලොවට ප්‍රකාශ වූ අවස්ථා **දෙකක්** ලියන්න.
(viii) ශාරීරික පුණ්‍ය ක්‍රියා **දෙකක්** ලියන්න.
(ix) චතාරික කාලයේ කතෝලිකයන් විසින් කරන පශ්චාත්තාපී අභ්‍යාස **දෙකක්** ලියන්න.
(x) උත්පත්ති පොතේ 1 : 28 වගන්තියට අනුව දෙවියන් වහන්සේ පුරුෂයා සහ ස්ත්‍රිය මවා ඔවුන්ට පැවරූ වගකීම් **දෙකක්** දක්වන්න.

**2.** (i) ශුද්ධ වූ ජුසේවාස් පියතුමා විසින් මෙරටට ගෙන්වා ගත් ඔරතෝරියානු නිකායික පියතුමන්ලා **දෙදෙනෙකු** නම් කරන්න.
(ii) ශුද්ධ වූ ජුසේවාස් පියතුමා තම ජීවිත කාලයේ දී සිදු කරන ලද ප්‍රාතිහාර්ය **තුනක්** ලියන්න.
(iii) ශුද්ධ වූ ජුසේවාස් පියතුමා තම මරණ මොහොතේ දී දෙන ලද අවසාන අවවාදය වූ "කිසියම් කෙනෙකු මුළු ජීවිත කාලය තුළ නොසලකා හැරිය දෙයක් ඔහුගේ මරණ මොහොතේ දී ඉටු කර ගත නොහැකියි" යන්න ඔබගේ ජීවිතයට ආදර්ශ කර ගත හැකි ආකාරය කරුණු **පහක්** ඇසුරෙන් පෙන්වා දෙන්න.

**3.** (i) විවාහය පිළිබඳ ව ශුද්ධ බයිබලයේ උත්පත්ති පොතේ සඳහන් ඉගැන්වීම් **දෙකක්** ලියන්න.
(ii) කිතුනු විවාහය මඟින් විවාහක යුවළ තම ගිවිසුම ආරක්ෂා කර ගත යුතු ආකාරය උදාහරණ **තුනකින්** දක්වන්න.
(iii) කිතුනු පවුලට එල්ල වන අභියෝග ජය ගත හැකි ආකාරය කරුණු **පහක්** ඇසුරෙන් විස්තර කරන්න.

**4.** (i) ශුද්ධ වූ ලූක් සුවිශේෂයට අනුව අන්තිම රාත්‍රී භෝජනය වේලාවේ දී රොටී ගෙන ජේසුස් වහන්සේ සිදු කළ ක්‍රියා **දෙකක්** සඳහන් කරන්න.
(ii) දිව්‍ය සත්ප්‍රසාද යාගය හඳුන්වන වෙනත් නම් **තුනක්** ලියන්න.
(iii) දිව්‍ය සත්ප්‍රසාදයෙන් පෝෂණය වන ඔබට ඔබේ ජීවිතය තුළින් අන් අයගේ ජීවිත පෝෂණය කිරීමට කළ හැකි ක්‍රියා **පහක්** කෙටියෙන් විස්තර කරන්න.

WWW.OLEVELAPI.COM

**5.** (i) ක්‍රිස්තුන් වහන්සේ තම ගෝලයින්ට ඉගැන්වූ යාච්ඤාව සහ ගෝලයින් වෙනුවෙන් කළ යාච්ඤාව නම් කරන්න.
(ii) ක්‍රිස්තුන් වහන්සේ තම ගෝලයින්ට ඉගැන්වූ යාච්ඤාව තුළ යාච්ඤා කළ යුතු ආකාරය ගැබ් වී ඇති බවට සාධක **තුනක්** ඉදිරිපත් කරන්න.
(iii) යාච්ඤාව කිතුනු ජීවිතයට ගසට පොත්ත මෙන් විය යුතු සේ, ඔබේ ජීවිතය තුළින් යාච්ඤාව අත් දකින ආකාරය කරුණු **පහකින්** කෙටියෙන් විස්තර කරන්න.

**6.** (i) ශුද්ධ වූ මතෙව්තුමාගේ සුවිශේෂයේ 5 : 21-26 වගන්තිවලට අනුව මිනිස් ජීවිත විනාශ කරන්නන් සහ තම සහෝදරයාට අපහාස කරන්නන් යටත් වන විනිශ්චය තත්ත්ව **දෙකක්** නම් කරන්න.
(ii) පස්වන පනතට විරුද්ධව ක්‍රියා කරන අවස්ථා **තුනක්** නම් කරන්න.
(iii) මිනිස් අභිමානය සහ ශුද්ධවන්තභාවය වර්ධනය කිරීමට කළ හැකි යහපත් ක්‍රියා **පහක්** කෙටියෙන් විස්තර කරන්න.

**7.** පහත සඳහන් මාතෘකාවලින් **දෙකක්** තෝරා ගෙන, කෙටි සටහන් ලියන්න.
(i) "සාමය ඇති කරන්නෝ භාග්‍යවන්තයෝ ය." (මතෙව් 5 : 3-9)
(ii) නිවැරදි හෘදය සාක්ෂිය
(iii) කිතුනු පවුල යාච්ඤාව උගන්වන ප්‍රථම පාසල වේ.
(iv) දේව දයානුකම්පාවේ වසර
(v) බිඳ වැටුණු ශක්තිය නැවත ගොඩනගන සුවදානයේ ප්‍රසාද නිධාන

❋ ❋ ❋

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....